Education Co-operative Society

# දිස්ත්‍රික් කාර්යාල/කලාප කාර්යාල සඳහා බදු පදනම යටතේ ගොඩනැගිලි ලබා ගැනීම සඳහා ටෙන්ඩර්පත්

සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතියේ පහත සඳහන් දිස්ත්‍රික්කයන්හි දිස්ත්‍රික් කාර්යාල/කලාප කාර්යාල පවත්වා ගෙන යාම සඳහා සුදුසු වාණිජමය ආරක්ෂිත කාර්යාලීය ගොඩනැගිල්ලක් බදු පදනම මත ලබා ගැනීම සඳහා කෙරෙන විවෘත ටෙන්ඩර්පත් කැඳවීමයි.

| අනු අංකය | දිස්ත්‍රික් කාර්යාල/කලාප කාර්යාල | ගොඩනැගිල්ල පිහිටිය යුතු නගරය | අවශ්‍ය වර්ග අඩි ප්‍රමාණය |
|---|---|---|---|
| 01 | ජයවර්ධනපුර/ හෝමාගම කලාප කාර්යාලය | මහරගම හෝ කොට්ටාව | 3,500 - 4,000 |
| 02 | වවුනියාව දිස්ත්‍රික් කාර්යාලය | වවුනියාව | 2,000 - 2,500 |

**ගොඩනැගිල්ල සම්බන්ධව සපුරාලිය යුතු සුදුසුකම්**

- ටෙන්ඩර් ඉදිරිපත් කරන ගොඩනැගිලි ඉහත සඳහන් නගරවල ප්‍රධාන මාර්ගයට හෝ අතුරු මාර්ගයකට මුහුණලා නගර ආසන්නයේ තිබිය යුතුය.
- ඉදිරිපත් කරන ගොඩනැගිල්ල කාර්යාලයක් පවත්වාගෙන යාමට සුදුසු ආකාරයෙන් තිබිය යුතු අතර, පොළොව ටයිල් වලින් අතුරා තිබිය යුතු ය.
- අවම වශයෙන් වාහන 02 හෝ 03 නතර කර තැබීමට ඉඩ පහසුකම් තිබිය යුතුය.
- නියම ප්‍රමිතියකින් යුක්ත සනීපාරක්ෂක පහසුකම් ලෙස අවම වශයෙන් වැසිකිළි 03 ක් වත් තිබිය යුතුය.
- **සම්පූර්ණ ගොඩනැගිල්ලම වායුසමනය කර තිබිය යුතුය. එම වායුසමන යන්ත්‍ර සේවා කටයුතු, අයිතිකරු විසින් සිදු කර දිය යුතුය.**
- ජලය හා විදුලි සැපයුම මනු කියවීම් වෙන් වෙන් වශයෙන් තිබිය යුතු අතර, ජලය රැස්කර තබා ගැනීම සඳහා අවම වශයෙන් ලීටර 500-1,000 ක ධාරිතාවයක් සහිත ජලටැංකි තිබිය යුතුය.
- ඉදිරිපත් කරන ටෙන්ඩර්පත් සමග ගොඩනැගිල්ලේ ගොඩනැගිලි සැලැස්ම, ගොඩනැගිල්ලේ වරිපනම් අංකය, පදිංචිය සනාථ කිරීමේ සහතිකය හා ඔප්පුවේ පිටපතක් අනිවාර්යයෙන්ම අමුණා තිබිය යුතු ය.
- ගොඩනැගිල්ලේ මාසික කුලිය මෙන් 6 ගුණයක මුදලක් අත්තිකාරම් වශයෙන් ලබාදෙනු ඇත.

අයිතිය සනාථ කරන සහ අදාළ අනෙකුත් සියලුම ලිපි ලේඛන සමග අයිතිකරුවන් හෝ අයිතිය ඇටෝර්ති බලපත්‍රයක් මඟින් හිමිකර දී ඇති ඇටෝර්නිලාභීන් විසින් පමණක් අදාළ මිල ගණන් 2025.09.30 දිනට පෙර සමිතියේ ප්‍රධාන සභාපතිට ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් පමණක් එවිය යුතු අතර, ටෙන්ඩර්පත් බහා එවන ලිපි කවරයේ වම් පස ඉහළ ගොඩනැගිලි බදුදීම සඳහා ටෙන්ඩර්පත්........ (අදාළ කාර්යාලයේ නම) සටහන් කර තිබිය යුතුය

**සැ.යු.** : ටෙන්ඩර්පත් ඉදිරිපත් කිරීමේදී ඒ සඳහා සකස් කරන ලද ආකෘති පත්‍රයක් ප්‍රධාන කාර්යාලය මගින් හෝ අදාළ දිස්ත්‍රික් කාර්යාල මගින් හෝ www.edcs.lk වෙබ් අඩවිය මගින් ලබාගත යුතු අතර, එම ආකෘති පත්‍රය මගින් පමණක් ටෙන්ඩර් එවිය යුතුය. ඔබ විසින් ඉදිරිපත් කරන ටෙන්ඩර්පත්වල අවසාන තීරණය ගනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වන අතර, එම තීරණය අවසාන තීරණය වේ.

**ප්‍රධාන සභාපති**
**සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණයදෙන සමිතිය,**
**අංක 294, ගාලු පාර, කොළඹ 03**